(03)

බස්නාහිර පළාතේ ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
மேல் மாகாண ஆளுநர் பணிமனை
# SECRETARIAT OF THE GOVERNOR - WESTERN PROVINCE

" ජනතා හිතවාදී විශිෂ්ඨතම පළාත් රාජ්‍ය සේවාවක් "

උමතු இல. / Your Ref.
මගේ අංකය / எனது இல. / My Ref. 1/1/4/260
දිනය / திகதி / Date 2014.06.30

ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට,
කොළඹ 05.

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙ විමර්ශන නිලධාරි තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය

උක්ත කාරණය සම්බන්ධ ඔබේ අංක 1/4/2/5/58 හා 2014.06.20 දිනැති ලිපිය හා බැඳේ.

ඒ අනුව බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙ විමර්ශන නිලධාරි තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය, 2014.06.27 දාතමින් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති බව කාරුණිකව දන්වමි.

අනුමත කරන ලද අදාල බඳවාගැනීමේ පරිපාටියේ පිටපතක් මෙ සමග ඔබ වෙත එවමි.

ජේ.සී.ජයලාල්,
පරිපාලන නිලධාරී,

අ/කලේ : සුනිල් අබේවර්ධන
ආණ්ඩුකාර ලේකම්(බ.ප)

පිටපත : ප්‍රධාන ලේකම්(බ.ප) - අනුමත කරණ ලද යථෝක්ත බඳවා ගැනීමේ පරිපාටියේ පිටපතක් මෙ සමග ඔබ වෙත එවමි.

4-260(2)


* පිළිතුරු සැපයීමේදී මගේ අංකය සඳහන් කරන්න. / பதில் அனுப்பும் போது எனது இலக்கத்தையும் திகதியையும் குறிப்பிடவும் / Please indicate my reference in the reply

| ලිපිනය / முகவரி Address | 98/4, හැව්ලොක් පාර, කොළඹ 05. 98/4, ஹெவ்லொக் வீதி, கொழும்பு 05. 98/4, Havelock Road, Colombo 05. | | | |
|---|---|---|---|---|
| | ආණ්ඩුකාර ලේකම් / ஆளுநரின் செயலாளர் Secretary to the Governor | සහකාර ලේකම් / உதவிச் செயலாளர் / Assistant Secretary | පරිපාලන නිලධාරී / நிர்வாக அதிகாரி / Administartive Officer | කාර්යාලය / அலுவலகம் / Office |
| දුරකථන / தொலைபேசி / Telephone | 011 2559164 | 011 2503044 | 011 3159587 | 011 2586743 0112586731 |
| ෆැක්ස් / பெக்ஸ் / Fax | 011 2503016 | | 011 2554156 | |
| විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail | secretary@governor.wp.gov.lk | as@governor.wp.gov.lk | ao@governor.wp.gov.lk | cma@governor.wp.gov.lk info@govsec.wpc.gov.lk |

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ
විමර්ශන නිලධාරී තනතුර
සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය.

18 JUN 2014

1. සම්බන්ධ වන ආයතන

| | | | |
|---|---|---|---|
| 1.1. දෙපාර්තමේන්තුව | :- පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප) | | |
| | | යොමු අංකය | :- එල්ජීඩී/02/21/03/32 |
| | | දිනය | :- 2014.05.22 |
| 1.2. අමාත්‍යාංශය | :- පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප) | | |
| | | යොමු අංකය | :- සීඑම්/ඩබ්පී/ටී15/517-3 |
| | | දිනය | :- 2014/05/28 |
| 1.3. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරීම | :- | යොමු අංකය | :- ඩීඑම්එස්/ඩී/පොදු/11-2 |
| | | දිනය | :- 2012.12.19 |
| 1.4. ප්‍රධාන ලේකම්(බ.ප) නිර්දේශය | :- | යොමු අංකය | :- CSO/PTR/15/3/2 |
| | | දිනය | :- 2014-06-11 |
| 1.5. වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය | :- | යොමු අංකය | :- NSCC/10/79/2/SA |
| | | දිනය | :- 2012.09.19 |
| 1.6. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය | :- | යොමු අංකය | :- 1/4/2/5/58 |
| | | දිනය | :- |
| 1.7. ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය | :- | යොමු අංකය | :- |
| | | දිනය | :- |

2. පත් කිරීමේ බලධාරියා :- බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

ක්‍රියාත්මකවන දිනය :- ගරු ආණ්ඩුකාරතුමා අනුමත කළ දින සිට ක්‍රියාත්මක වේ.

3. සේවා ගණය පිළිබඳ විස්තර

3.1. සේවා ගණය :- ආශ්‍රිත නිලධාරීන්

3.2. ශ්‍රේණි :- III, II, I ශ්‍රේණි වලින් සමන්විතයි.

3.3. පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය. :- පළාත් පාලන ආයතන පරිපාලනය කිරීමේ ක්‍රියාවලියේදී පළාත් පාලන දෙපාර්තමේන්තුවට අවශ්‍ය සහාය ලබාදීම.

3.4. කාර්යයන් පැවරීම :- පළාත් පාලන ආයතනවල පරිපාලනය පිළිබඳව පළාත් පාලන කොමසාරිස් වෙත පැවරී ඇති නෛතික බලතල ක්‍රියාත්මක කිරීමට සහාය වීම, අවශ්‍ය අවස්ථාවලදී පළාත් පාලන ආයතනවලට උපදෙස් ලබා දීම හා මූලික විමර්ශන කටයුතු සිදුකිරීම හා විධිමත් විනය පරීක්ෂණවල පැමිණිල්ල මෙහෙයවීම.

4. තනතුරෙහි/තනතුරුවල ස්වභාවය :- ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය.

අනුමත කරමි / නොකරමි.

දිනය 2014.06.27

එස්. අලවි මව්ලානා
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

5. වැටුප්

5.1. වැටුප් කේත අංකය :- **MN 4 – 2006A (රා.ප.ච.6/2006 iv)**

5.2. වැටුප් පරිමාණය :- **15,215-10x 215-4x240-7x320-15x360-25965**

5.3. ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :-

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | පියවර 01 | රු.15,215 |
| II | පියවර 12 | රු.17,605 |
| I | පියවර 23 | රු.20,925 |

6. සේවා ගණයට අයත් තනතුර/තනතුරු :-

6.1. අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :-

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| විමර්ශන නිලධාරී | III, II, I | 70 | • පළාත් පාලන ආයතනවල පරිපාලනය පිළිබඳව පළාත් පාලන කොමසාරිස් සහ පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත පැවරී ඇති නෛතික බලතල ක්‍රියාත්මක කිරීමට සහාය වීම හා සම්බන්ධීකරණය.<br>• අවශ්‍ය අවස්ථාවලදී පළාත් පාලන ආයතනවලට උපදෙස් ලබා දීම.<br>• මූලික විමර්ශන කටයුතු සිදුකිරීම.<br>• විධිමත් විනය පරික්ෂණවල පැමිණිල්ල මෙහෙයවීම.<br>• ආයතන පරික්ෂණ කටයුතු කිරීම. |

6.2. ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :- 70යි.

7. බඳවා ගැනීමේ ක්‍රමය

7.1. බඳවා ගන්නා ප්‍රතිශතයන් :-

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | අදාළ නැත. |
| කුසලතා | අදාළ නැත. |

7.2. විවෘත බඳවා ගනීම

7.2.1. බඳවා ගන්නා ශ්‍රේණිය :- III ශ්‍රේණිය.

7.2.2. සුදුසුකම්

7.2.2.1. අධ්‍යාපන සුදුසුකම් :- විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ව්‍යාපාර කළමනාකරණය, රාජ්‍ය පරිපාලන, මූල්‍ය කළනාකරණය හෝ වාණිජවේදී උපාධියක් ලබා තිබීම.

7.2.2.2. වෘත්තීය සුදුසුකම් :- අදාළ නැත.

7.2.2.3. පළපුරුද්ද :- අදාළ නැත.



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : VI/4/260 දිනය : 2014.06.27

7.2.2.4. කායික සුදුසුකම් :- බස්නාහිර පළාතේ ඕනෑම දිස්ත්‍රික්කයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.2.2.5. වෙනත් :-

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.
III. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

7.2.3. වයස

7.2.3.1. අවම සීමාව :- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 21ට නොඅඩු විය යුතුය.

7.2.3.2. උපරිම සීමාව :- අවුරුදු 35ට නොවැඩි විය යුතුය. (දැනටමත් රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

7.2.4. බඳවා ගැනීමේ ක්‍රමය

7.2.4.1. ලිඛිත විභාගය

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| සාමාන්‍ය දැනුම | 100 | 40% |
| අභියෝගතා පරික්ෂණය | 100 | 40% |

සටහන :- ලකුණු ලබාගැනීමේ අනුපිළිවෙළ අනුව වැඩි ලකුණු ලබාගත් අයගෙන් පුරප්පාඩු පුරවනු ලැබේ.

විෂය නිර්දේශය - ඇමුණුම අංක 01.

7.2.4.1.1. පවත්වන බලධරයා :- බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ එහි බලය පැවරෙන ආයතනයක්.

7.2.4.2. වෘත්තීය පරික්ෂණය :- අදාළ නැත.

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| | | |

7.2.4.2.1. පවත්වන බලධරයා

7.2.4.3. සාමාන්‍ය සම්මුඛ පරික්ෂණය

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු :- මෙහිදී ලකුණු ලබා දෙනු නොලැබේ. මූලික සුදුසුකම් පරික්ෂා කිරීම සඳහා පමණක් පවත්වනු ලැබේ.

7.2.4.3.1. සාමාන්‍ය සම්මුඛ පරික්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා :- බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

7.2.4.4. ව්‍යුහගත සම්මුඛ පරික්ෂණය :- අදාළ නැත.

1/4/260 2014/06/27

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| | | |

7.2.4.4.1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා

7.2.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :- ගැසට් පත්‍රයේ හෝ පුවත්පත් දැන්වීම් පළකිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3. සීමිත බඳවා ගැනීම :- අදාළ නැත.

7.3.1. බඳවා ගන්නා ශ්‍රේණිය :-

7.3.2. සුදුසුකම්

7.3.2.1. අධ්‍යාපන සුදුසුකම් :-

7.3.2.2. වෘත්තීය සුදුසුකම් :-

7.3.2.3. පළපුරුද්ද :-

7.3.2.4. කායික සුදුසුකම් :-

7.3.2.5. වෙනත් :-

7.3.3. වයස

7.3.3.1. අවම සීමාව :-

7.3.3.2. උපරිම සීමාව :-

7.3.4. බඳවා ගැනීමේ ක්‍රමය

7.3.4.1. ලිඛිත විභාගය :-

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| | | |

7.3.4.1.1. පවත්වන බලධරයා :-

7.3.4.2. වෘත්තීය පරීක්ෂණය :-

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| | | |

7.3.4.2.1. පවත්වන බලධරයා

7.3.4.3. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණ :-

7.3.4.3.1. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා :-

7.3.4.4. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :-

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| | | |

7.3.4.4.1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා :-

7.3.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :-

7.4. කුසලතා පදනම මත බඳවා ගැනීම :- අදාළ නැත.

7.4.1. බඳවා ගන්නා ශ්‍රේණිය

7.4.2. සුදුසුකම්

7.4.2.1. අධ්‍යාපන සුදුසුකම්

පොදු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ලේඛන අංකය : 4/1/4/960. දිනය : 2014/06/27

7.4.2.2. වෘත්තිය සුදුසුකම්

7.4.2.3. පළපුරුද්ද

7.4.2.4. කායික සුදුසුකම්

7.4.2.5. වෙනත්

7.4.3. වයස

7.4.3.1. අවම සීමාව

7.4.3.2. උපරිම සීමාව

7.4.4. බඳවා ගැනීමේ ක්‍රමය

7.4.4.1. ලිඛිත විභාගය

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| | | |

7.4.4.1.1. පවත්වන බලධරයා :-

7.4.4.2. වෘත්තිය පරික්ෂණය :-

| වෘත්තිය පරික්ෂණය විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| | | |

7.4.4.2.1. පවත්වන බලධරයා

7.4.4.3. සාමාන්‍ය සම්මුඛ පරික්ෂණය :-

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණ

7.4.4.3.1. සාමාන්‍ය සම්මුඛ පරික්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා

7.4.4.4. ව්‍යුහගත සම්මුඛ පරික්ෂණය :-

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| | | |

7.4.4.4.1. ව්‍යුහගත සම්මුඛ පරික්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා

7.4.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :-

## 8. කාර්යක්ෂමතා කඩඉම

8.1.

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරික්ෂණය/ වෘත්තිය පරික්ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත් |
|---|---|---|
| 1වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ගත වීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය. (විභාග විෂය නිර්දේශය - ඇමුණුම අංක 02) | ලිඛිත |
| 2වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස්වී වසර 03ක් ගත වීමට පෙර දෙවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය. (විභාග විෂය නිර්දේශය - ඇමුණුම අංක 03) | ලිඛිත |
| 3වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස්වී වසර 05ක් ගත වීමට පෙර තෙවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය. (විභාග විෂය නිර්දේශය - ඇමුණුම අංක 04) | ලිඛිත |

1/1/4/260 2014/06/27

8.2. කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද? :- වසරකට වරක්.

8.3. කාර්යක්ෂමතා කඩඉම් වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද? :-

| | |
|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම<br>2 වන කාර්යක්ෂමතා කඩඉම<br>3 වන කාර්යක්ෂමතා කඩඉම | බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ එහි බලය පවරනු ලබන ආයතනයක් මගින්. |

9. භාෂා ප්‍රවීණතාවය

9.1.

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| 1. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | රා.ප.ච.01/2014 චක්‍රලේඛයේ විධිවිධානයන්ට අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාවය ලබා ගත යුතුය. |
| 3. සන්ධාන භාෂාව(අදාළ වන්නේ නම් පමණි) | අදාළ නැත. |

10. ශ්‍රේණි උසස් කිරීම

10.1. III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම

10.1.1. III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.1.1.1. සපුරාලිය යුතු සුදුසුකම් :-

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර 10ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලයට නියමිත සියලුම වැටුප් වර්ධක උපයාගන තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර 10ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ(05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගෙන තිබීම.

VI. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.

10.1.1.2. උසස් කිරීමේ ක්‍රමය :-

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරීන් II වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා අදාළ පත්වීම් බලධරයා වෙත නියමිත ආකෘති පත්‍රය මගින් ඉල්ලීමක් කළ විට සේවයේ වසර 10 සම්පූර්ණ කරන දින හෝ සුදුසුකම් සම්පූර්ණ කරන දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට උසස්වීම ලබා දෙනු ලැබේ.

1/1/4/260 ... 2014/06/27

10.2. II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම

10.2.1. II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.2.1.1. සපුරාලිය යුතු සුදුසුකම් :-

I. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලය තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

II. අනුමත කාර්යසාධනය ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

III. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

IV. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.

10.2.1.2. උසස් කිරීමේ ක්‍රමය :-

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරීන් I වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා අදාළ පත්වීම් බලධරයා වෙත නියමිත ආකෘති පත්‍රය මගින් ඉල්ලීමක් කළ විට පත්වීම් බලධරයා විසින් සේවයේ වසර 10 සම්පූර්ණ කරන දින හෝ සුදුසුකම් සම්පූර්ණ කරන දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට උසස්වීම ලබා දෙනු ලැබේ.

10.3. 1 වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම :- අදාළ නැත.

10.3.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව උසස් කිරීම

10.3.1.1. සපුරාලිය යුතු සුදුසුකම් :-

10.3.1.2. උසස් කිරීමේ ක්‍රමය :-

11. තනතුරු වලට පත් කිරීම :- අදාළ නැත.

11.1. සුදුසුකම්

| තනතුර | සුදුසුකම් | තෝරාගනු ලබන ආකාරය |
|---|---|---|
| | | |
| | | |

(අවශ්‍ය වේ නම් ඇමුණුමක් භාවිතා කරන්නත)

12. බඳවාගැනීම් පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නාවූ කොන්දේසි :-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලටද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයටද, කලින් කළ බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝගවලටද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කළ පනවනු ලබන නියෝගවලටද, අමාත්‍යංශය හා දෙපාර්තමේන්තු නියෝගවලටද, ආයතන ප්‍රධානීන් විසින් නිකුත් කරනු ලබන නියෝගවලටද අනුව කටයුතු කළ යුතුය.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : 1/1/4/260 දිනය : 2014/06/27

13. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන අර්ථ නිරූපන වලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපන :-

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපන වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපන කිසිවක් වේතොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව / බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කරනු ඇත.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය

14.1.1. III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම :-

මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත වන දිනට විමර්ශන නිලධාරී තනතුරෙහි වසර දහය (10)ක සේවා කාලයක් සපුරා නොමැති හා වසර දහය (10)ක් සම්පූර්ණ නමුත් නියමිත කාර්යක්ෂමතා කඩඉම සමත් වී නොමැති නිලධාරීන් මෙම පරිපාටියට අනුව III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

14.1.2. II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම :-

මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත වන දිනට විමර්ශන නිලධාරී තනතුරෙහි වසර 10ක් සම්පූර්ණ කර ඇති හා නියමිත කාර්යක්ෂමතා කඩඉම සමත් නිලධාරීන් මෙම පරිපාටියට අනුව II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

14.1.3. I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම :-

- මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත වන දිනට විමර්ශන නිලධාරී තනතුරෙහි වසර විස්සක (20) සේවා කාලයක් සපුරා ඇති හා නියමිත කාර්යක්ෂමතා කඩඉම සමත් නිලධාරීන් මෙම පරිපාටිය අනුව I ශ්‍රේණියට අන්තර්ග්‍රහණයකරනු ලැබේ.

- මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී තනතුරෙහි වසර දහයක (10) සේවා කාලයක් සපුරා ඇති හා නියමිත කාර්යක්ෂමතා කඩඉම සමත් නිලධාරීන්ද මෙම පරිපාටියට අනුව විමර්ශන නිලධාරී I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

සටහන :-

- අන්තර්ග්‍රහණයෙන් අනතුරුව අදාළ ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුය.
- අන්තර්ග්‍රහණය කරන දිනට අන්තර්ග්‍රහණය කරන තනතුරට පත්වීමට අවශ්‍ය සේවා කාලයට වඩා වැඩිපුර සේවය කර ඇති කාලය ඊළඟ ඉහළ තනතුරට උසස් කිරීමේදී අවශ්‍ය සේවා කාලය සඳහා සලකා බලනු ලැබේ.
- අන්තර්ග්‍රහණය කිරීම මත වැටුප් ගෙවීම ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 4 වන වගන්ති අනුව විය යුතු අතර එහිදී වැටුප් වර්ධක දිනයේ වෙනසක් සිදු නොවනු ඇත.

15. මෙම පරිපාටියේ විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා තීරණය කරනු ඇත.



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය 1/1/4/260. දිනය 2014/06/27

අර්ථ නිරූපන

➢ සතුටුදායක සේවා කාලය:

සතුටුදායක සේවා කාලයක් යනු රජයේ නිලධාරියෙකු විසින් කාර්යක්ෂමතා හා අනලස්ව රාජකාරිය ඉටු කිරීම මගින් ද, සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් නියමිත දිනට සමත්වීම මගින්ද, ස්ථිර කිරීම සඳහා අවශ්‍ය අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින් ද එම කාලය තුළදී උපයා ගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාල සීමාවක් වන්නේය. (අවවාද කිරීම්/ තදින් අවවාද කිරීම් හැර)

➢ සක්‍රිය සේවා කාලය:-

සක්‍රිය සේවා කාලය යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයෙන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

➢ නියමිත දිනට:-

අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතු දිනය. 'නියමිත දිනය' ලෙස අදහස් කෙරේ. ශ්‍රේණි උසස්වීම්වලදී නියමිත දිනට හෝ ඊට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත්වන නිලධාරින්ට බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් පරිදි උසස්වීම් ලැබීමට හිමිකම් ඇත. නියමිත දිනට සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

| | | | |
|---|---|---|---|
| සකස් කලේ | : [signature] | පරික්ෂා කලේ | : [signature] |
| නම | : ජී. එස්. පී. ඩබ්. සෙනෙවිරත්න | නම | : එච් ඒ එස්. සෙව්වන්දි |
| තනතුර | : පරිපාලන නිලධාරී | තනතුර | : ශ්‍රී. ලං. ප. සේ. III |
| දිනය | : පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.) 14/05/20 | දිනය | : සහකාර පළාත් පාලන කොමසාරිස් පලාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.) කොළඹ-07. |

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : [signature]

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : පළාත් පාලන කොමසාරිස්

තනතුර : පළාත් පාලන කොමසාරිස්

දිනය : බස්නාහිර පළාත 5/22

---

දිනය : 2014/05/28

යොමු අංකය : CM/WP/E/6/5/1-3

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙහි විමර්ශන නිලධාරී තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : [signature]

පළාත් පාලන ලේකම්

දිනය : 2014/5/30

නිල මුද්‍රාව: එස්.ඊ. කොඩිකාර ලේකම් පළාත් පාලන ... විදුලිබල හා මාර්ග ... අමාත්‍යාංශය (බ.ප.) ... 32 ශ්‍රීමත් ... මාවත

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : 1/4/4/260. දිනය 2014/06/27

-----

දිනය : 2014-06-05 යොමු අංකය : CSO/PTR/15/3/2

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙහි විමර්ශන නිලධාරී තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..........................
ප්‍රධාන ලේකම්

දිනය : 2014-06-11 නිල මුද්‍රාව: ජේ. එම්. සී. ජයන්ති විජේතුංග
ප්‍රධාන ලේකම් (බස්නාහිර පළාත)
"ශ්‍රාවස්ති මන්දිරය"
32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

-----

දිනය :.......................... යොමු අංකය : 1/4/2/5/58

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙහි විමර්ශන නිලධාරී තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..........................
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

දිනය : 2014. 06. 20 නිල මුද්‍රාව: ඩී. රාජපක්ෂ
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ
532/7, ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට, කොළඹ - 05.

-----

දිනය : 2014. 06. 27 යොමු අංකය : 1/1/4/260

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙහි විමර්ශන නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය 2014.06.27 දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද.

අත්සන : ..........................
ආණ්ඩුකාර ලේකම්.

දිනය : 2014. 06. 27 නිල මුද්‍රාව: සුනිල් අබේවර්ධන,
බ.ප. ආණ්ඩුකාර ලේකම්
බ.ප. ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
98/4, හැව්ලොක් පාර,
කොළඹ 05.

-----

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : 1/1/4/260. දිනය : 2014/06/27

ඇමුණුම 01.

## විමර්ශන නිලධාරී III ශ්‍රේණියේ තනතුරට (විවෘත) බඳවා ගැනීම සඳහා වන පරීක්ෂණය.

1. විභාගයේ/ ~~වෘත්තීය පරීක්ෂණයේ~~ නම :- විමර්ශන නිලධාරී III ශ්‍රේණියට බඳවා ගැනීමේ පරීක්ෂණය - (විවෘත)

2. විභාගය/ ~~වෘත්තීය පරීක්ෂණය~~ පිළිබඳ විස්තර :-

| ප්‍රශ්න පත්‍රය/විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| සාමාන්‍ය දැනීම | 100 | 40 % |
| අභියෝගතා පරීක්ෂණය | 100 | 40 % |

3. පවත්වනු ලබන බලධරයා :- බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ බලය පැවරෙන ආයතනයක්.

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :- ඇතිවන පුරප්පාඩු සංඛ්‍යාව සලකා බැලීමෙන් පසුව.

5. විභාග සඳහා වන විෂය නිර්දේශය:

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| සාමාන්‍ය දැනීම | මෙම ප්‍රශ්න පත්‍රය ආර්ථික, සාමාජයීය, අධ්‍යාපන, විද්‍යාත්මක, සංස්කෘතික, දේශපාලනික මෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාල දේශීය, විදේශීය වශයෙන් වැදගත් වන්නා වූ කාලීන සිද්ධීන් පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කෙරෙන ප්‍රශ්න වලින් සමන්විත වේ. |
| අභියෝගතා පරීක්ෂණය | අපේක්ෂකයන්ගේ භාෂා හැකියාව, තර්කන ශක්තිය හා ගණිතමය හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් වූවකි. |

අත්සන : ..................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ඉන්ද්‍රානි සමරකෝන්.

තනතුර : පළාත් පාලන කොමසාරිස්
බස්නාහිර පළාත

දිනය : ..................................

5/22

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/1/4/260. දිනය : 2014/06/27

ඇමුණුම 02

## විමර්ශන නිලධාරී තනතුර සඳහා වන I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

1. විභාගයේ/ ~~වෘත්තීය පරීක්ෂණයේ~~ නම :- විමර්ශන නිලධාරී තනතුර සඳහා වන I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

2. විභාගය/ ~~වෘත්තීය පරීක්ෂණය~~ පිළිබඳ විස්තර :-

| ප්‍රශ්න පත්‍රය/විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| ගිණුම් හා මුදල් රෙගුලාසි. | 100 | 40 % |
| පළාත් පාලන ආයතනවල නෛතික පසුබිම හා ආයතන සංග්‍රහය. | 100 | 40 % |

3. පවත්වනු ලබන බලධරයා :- බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ එහි බලය පැවරෙන ආයතනයක්.

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :- වසරකට වරක්.

5. විභාග සඳහා වන විෂය නිර්දේශය :-

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ගිණුම් හා මුදල් රෙගුලාසි | පළාත් පාලන ආයතන වලට අදාළ ගිණුම් තැබීම්, පළාත් පාලන විගණනය, බස්නාහිර පළාතේ මූල්‍ය රීති. |
| පළාත් පාලන ආයතනවල නෛතික පසුබිම හා ආයතන සංග්‍රහය | • ආයතන සංග්‍රයේ I, කාණ්ඩයේ II, III, IV, V, VII, VIII, XII, XIII, XIV, XV, XVI, XVII කොටස් සම්බන්ධ දැනුම.<br>• ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVII හා XLVIII පරිච්ඡේද සම්බන්ධ දැනුම.<br>• මහ නගර සභා ආඥා පනත, නගර සභා ආඥා පනත, **1987** අංක **15** දරණ ප්‍රාදේශීය සභා පනත. |

අත්සන : ........................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : චන්ද්‍රානි සමරකෝන්
ස.නතුර : පළාත් පාලන කොමසාරිස් බස්නාහිර පළාත
දිනය : ........................................
5/22

ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය 1/1/4/260 දිනය 2014/06/27

ඇමුණුම 03

## විමර්ශන නිලධාරී තනතුර සඳහා වන II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

1. විභාගයේ/ ~~වෘත්තිය පරීක්ෂණයේ~~ නම :- විමර්ශන නිලධාරී තනතුර සඳහා වන II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

2. විභාගය/ ~~වෘත්තිය පරීක්ෂණය~~ පිළිබඳ විස්තර :-

| ප්‍රශ්න පත්‍රය/විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| ගිණුම් ක්‍රම, මුදල් රෙගුලාසි හා රීති | 100 | 40 % |
| පළාත් පාලන ආයතනවලට අදාළ මූලික පනත් හා ආනුෂාංගික නීති | 100 | 40 % |

3. පවත්වනු ලබන බලධරයා :- බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ එහි බලය පැවරෙන ආයතනයක්.

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :- වසරකට වරක්.

5. විභාග සඳහා වන විෂය නිර්දේශය :-

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ගිණුම් ක්‍රම, මුදල් රෙගුලාසි හා රීති | ප්‍රාදේශීය සභා රීති හා ප්‍රාදේශීය සභා ගිණුම් ක්‍රමය, නගර සභා මූල්‍ය රීති හා නගර සභා ගිණුම් ක්‍රමය, නගර සභා, ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථා පැනවීම සම්බන්ධ විධිවිධාන |
| පළාත් පාලන ආයතනවලට අදාළ මූලික පනත් හා ආනුෂාංගික නීති | ප්‍රාදේශීය සභා පනත, නගර සභා ආඥා පනත, පළාත් පාලන ආයතනවලට අදාල සම්මත අතුරු ව්‍යවස්ථා, පළාත් පාලන මූලික පනත්වලට අදාල ආනුෂාංගික පනත් හා නීති. |

අත්සන : ..........................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ..........................

තනතුර : ..........................

බස්නාහිර පළාත

දිනය : ..........................

5/22

1/1/4/260 2014/06/21

ඇමුණුම 04

<u>විමර්ශන නිලධාරී තනතුර සඳහා වන III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.</u>

1. විභාගයේ/ ~~වෘත්තිය පරීක්ෂණයේ~~ නම :- විමර්ශන නිලධාරී තනතුර සඳහා වන III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

2. විභාගය/ ~~වෘත්තිය පරීක්ෂණය~~ පිළිබඳ විස්තර :-

| ප්‍රශ්න පත්‍රය/විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| ගිණුම් හා මුදල් රෙගුලාසි | 100 | 40 % |
| ආයතන සංග්‍රහය හා පළාත් පාලන ආයතනවලට අදාළ මූලික පනත් හා ආනුෂාංගික රීති | 100 | 40% |

3. පවත්වනු ලබන බලධරයා :- බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ බලය පැවරෙන ආයතනයක්.

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :- වසරකට වරක්.

5. විභාග සඳහා වන විෂය නිර්දේශය :-

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ගිණුම් හා මුදල් රෙගුලාසි | • පළාත් සභා මූල්‍ය රීති පිළිබඳ දැනුම.<br>• පළාත් පාලන ආයතනවල අය - වැය ලේඛණ පිළියෙල කිරීම පිළිබඳ මූලික දැනුම.<br>• පළාත් පාලන ආයතනවල අවසාන ගිණුම් පිළියෙල කිරීම පිළිබඳව ගැඹුරින් විමසා බැලීම. |
| ආයතන සංග්‍රහය හා පළාත් පාලන ආයතනවල මූලික පනත් හා ආනුෂාංගික රීති | • ආයතන සංග්‍රයේ I, කාණ්ඩයේ II, III, IV, V, VIII, XII, XXI, XXXII මූලික දැනුම.<br>• ආයතන සංග්‍රයේ II, කාණ්ඩයේ XLVII, XLVIII පරිච්ඡේදයට අනුව විනය කටයුතු පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම.<br>• පැමිණිල්ල මෙහෙයවීම් හා මූලික විමර්ශන පිළිබඳව ඇති දැනුම පරීක්ෂා කිරීම.<br>• පළාත් පාලන ආයතනවලට සම්බන්ධ අනපනත් පිළිබඳ අවබෝධය පිළිබඳව ගැඹුරින් විමසා බැලීම. |

අත්සන : ..............................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : චන්ද්‍රානි සමරකෝන්

තනතුර : පළාත් පාලන කොමසාරිස් බස්නාහිර පළාත

දිනය : 5/22

1/1/4/260 ... 2014/06/27

ඇමුණුම 05.

<u>ශ්‍රේණි උසස්වීම් ලබා ගැනීම සඳහා වූ අයදුම්පත්‍රය</u>

1. නිලධාරියා පිළිබඳ තොරතුරු.
   - 1.1 අයදුම්කරුගේ සම්පූර්ණ නම : ......................................................................
   - 1.2 හැඳුනුම්පත් අංකය : ......................................................................
   - 1.3 සේවා ස්ථානය හා එහි ලිපිනය : ......................................................................
   - 1.4 අයත්වන සේවය හා තනතුර : ......................................................................
   - 1.5 අයත්වන සේවා ගණය හා ශ්‍රේණිය : ......................................................................

2 පත්වීම පිළිබඳ තොරතුරු
   - 2.1 පත්වීම් දිනය : ......................................................................
   - 2.2 පත්වීම් ස්ථිර කල දිනය : ......................................................................
   - 2.3 සමත්වූ කාර්යක්ෂමතා කඩඉම හා සමත් දිනය:

| සමත්වූ කාර්යක්ෂමතා කඩඉම | සමත්විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

   - 2.4 සමත් වූ භාෂා ප්‍රවීනතා මට්ටම හා සමත් දිනය:

| සමත්වූ භාෂා ප්‍රවීණතා මට්ටම | සමත් විය යුතු දිනය | සමත්වූ දිනය |
|---|---|---|
| | | |

3 උසස් වීමට අදාළ තොරතුරු
   - 3.1 උසස් වීමට අපේක්ෂිත ශ්‍රේණිය : 11/1/විශේෂ
   - 3.2 උසස් වීමට අපේක්ෂිත ධාරාව : සාමාන්‍ය
     - 3.2.1 අවශ්‍ය සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කර තිබේද? ඔව්/නැත.
     - 3.2.2 සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කළ දිනය : ......................................................................
     - 3.2.3 අපේක්ෂිත සක්‍රිය සේවා කාලය තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ මට්ටමේ කාර්යසාධනයක් පෙන්නුම්කර තිබේද? ඔව්/නැත.
     - 3.2.4 නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබේද? ඔව්/නැත.<br>උසස්වීමට පූර්වාසන්න පස් වසර තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබේද?<br>ඔව්/නැත.
     - 3.2.5 විනය දඬුවම් ලබා තිබේද? ඔව්/නැත.

4 අයදුම්කරුගේ ප්‍රකාශය.

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, මා හට විරුද්ධව නොනිමි විනය පරීක්ෂණයක් නොමැති බවත් ............................ දින සිට සාමාන්‍ය කාර්යසාධනය යටතේ 11/1/විශේෂ ශ්‍රේණියට උසස්වීමට අදාළ සුදුසුකම් සපුරා ඇති බවත් සහතික කරමි.

..................................................

දිනය නිලධරයාගේ අත්සන.

4/1/4/260 2014/06/27

5 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

ඉහත සඳහන් සියළු තොරතුරු සත්‍ය හා නිවැරැදි බවත්, ඉහත නම් සඳහන් ............................................ මහතා/මහත්මිය/මෙනෙවිය ..........................................................සේවා ගණයේ ............. ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය යටතේ උසස් කිරීම සඳහා වූ සියළු කරුණු සම්පූර්ණ කර ඇති බවටත් සෑහීමකට පත්වෙමි.ඒ අනුව එම නිලධාරියා ඉහත ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි.

නම : ........................................
අත්සන : ........................................
දිනය : ........................................
නිල මුද්‍රාව : ........................................

6 අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය

දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඉහතින් දක්වා ඇති කරුණු නිවැරැදි බවත්/ නිවැරැදි නොවන බවත්, ඒ අනුව ඉහත නිර්දේශ හා එකඟ වන බවත්/නොවන බවත්, කාරුණිකව දන්වමි.

නම : ........................................
අත්සන : ........................................
දිනය : ........................................
නිල මුද්‍රාව : ........................................

7 ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය

ඉහත සඳහන් සියළු තොරතුරු සත්‍ය හා නිවැරැදි බවත්, ඒ අනුව ............................................ මහතා/මහත්මිය/මෙනෙවිය ........................................................ සේවා ගණයේ ............. ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය යටතේ උසස් කිරීම නිර්දේශ කරමි.

නම : ........................................
අත්සන : ........................................
දිනය : ........................................
නිල මුද්‍රාව : ........................................

8 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්/පත්වීම් බලධරයා.

ඉහත සඳහන් සියළු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඒ අනුව ........................................ මහතා/ මහත්මිය/මෙනවිය ...................... සේවා ගණයේ .......................... ශ්‍රේණියට සාමාන්‍ය කාර්යසාධනය යටතේ ....................................... දින සිට උසස් කිරීම නිර්දේශ කර අනුමැතියට ඉදිරිපත් කරමි.

නම : ........................................
අත්සන : ........................................
දිනය : ........................................
නිල මුද්‍රාව : ........................................

භාර ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
අංකය 1/1/4/260 දිනය 2014/06/21